Sinhalese



# වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන් හඳුන්වාදීම

## ළමුන්ගේ ඉගෙනීම කෙරෙහි ඇති නව ප්‍රවේශය සහ වික්ටෝරියානු පාසැල්වල සම්මතයන් සම්බන්ධයෙන් දෙමාපියන් හට වැදගත් තොරතුරු

VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY

# වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන්

**වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන්** මගින් සියළුම වික්ටෝරියානු පාසැල්වල බාලාංශයේ සිට වසර 10 තෙක් විෂයමාලාවලට නව ප්‍රවේශයක් ලබාදේ. සම්මතයන් මගින් පාසැල් වේලාවේදී සිසුන් විසින් කුමන දෑ ඉගෙන ගැනීම සහ කුමන දෑ වර්ධනය කර ගැනීම වැදගත්වේද යන්න පැහැදිලි කර දේ. මේවා සැලසුම් කර ඇත්තේ අත්‍යාවශ්‍ය දැනුම, නිපුණතාවයන් සහ හැසිරීම පිළිබඳව ගැඹුරු අවබෝධයක් ලබා ගැනීම උනන්දු කරවන ආකාරයටය. සිසුන්ගේ ඉගෙනීම සැලසුම් කිරීමටත්, සිසුන්ගේ ප්‍රගතිය ඇගයීමටත්, දෙමාපියන් හට වාර්තා කිරීමටත් මෙම සම්මතයන් උපයෝගී කර ගනු ලැබේ.

වික්ටෝරියානු විෂය මාලා සහ ඇගයීමේ අධිකාරිය (VCAA) මගින් ජාතික සහ අන්තර්ජාතික වශයෙන් කරන ලද පර්යේෂණවලින් අනතුරුව මෙම සම්මතයන් වර්ධනය කර ඇත. වික්ටෝරියානු ගුරුවරුන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර අධ්‍යාපන කණ්ඩායම් සහ පුළුල් ප්‍රජාව වෙතින් අදහස් විමසීම් සිදුවිය. මෙම කණ්ඩායම් අතරට වික්ටෝරියානු නගරබද සහ පළාත්බද දෙමාපිය නියෝජිත කණ්ඩායම් ඇතුලත් විය. මෙම අදහස් විමසීමේ කොටසක් වශයෙන් VCAA වෙත ප්‍රතිචාර සහ අදහස් දැක්වීම් 1000කට අධික ප්‍රමාණයක් ලැබිණ.

## නව ප්‍රවේශය සඳහා අවශ්‍යතාව

තරුණයන්ගේ අපේක්ෂාවන් වෙනස් වෙමින් පවතී. වික්ටෝරියාව සතුව යහපත් පාසැල් සහ යහපත් වැඩසටහන් තිබෙන අතර යහපත් ගුරුවරුන් සිටියද සිසුන් ඉගෙන ගන්නේ කෙසේද යන්නත් සාර්ථක ලෙස ඉගෙනීම සඳහා ඔවුන් හට කුමක් අවශ්‍යද යන්නත් නිරන්තරයෙන් සොයා බැලීම වැදගත්වේ.

දැනුම ඉහලින් අගයන සහ දැනුම නිරන්තරයෙන් වෙනස්වන, වැඩපල, සමාජය, ප්‍රජාව සහ පුද්ගලික සබඳතා සංකීර්ණ ලෙස පීඩනයන්ට යටත්වන ලොවක ඇති අභියෝගයන් ජය ගැනීම සඳහා තරුණයන් සූදානම් කිරීම මෙම සම්මතයන්ගේ අරමුණවේ.

තරුණයන් හට සාර්ථක වීම සඳහා පුළුල් පරාසයක දැනුම සහ සමාජ, පුද්ගලික සහ සිතීමේ කුසලතා අවශ්‍යවේ. මෙම සම්මතයන් හේතුවෙන් තරුණයන් හට පාසැල් යාම මගින් වර්ධනය වීමට සහ පහත සඳහන් විභාගයන්හි අවසාන වසර කිහිපය සඳහා සූදානම් වීමටත් උපකාරවේ:

- වික්ටෝරියානු අධ්‍යාපන සහතිකය (VCE)
- වික්ටෝරියානු ව්‍යවහාරික ඉගෙනීමේ සහතිකය (VCAL)

VCE හෝ VCAL හි කොටසක් වශයෙන් වෘත්තීය අධ්‍යාපන හෝ පුහුණු කිරීමේ (VAT) වැඩසටහන් වුවද හැදෑරිය හැක.

## වෙනස් නොවන දේ කුමක්ද? වෙනස් වන්නේ කුමක්ද?

ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය, මානව විද්‍යාව, භාෂා සහ කලාව වැනි සම්ප්‍රදායික විෂය ක්ෂේත්‍රයන්හි දැනුම සහ අවබෝධය වර්ධනය කර ගැනීම සිසුන් විසින් දිගටම සිදු කරනු ඇත. කෙසේවුවද, නව ප්‍රවේශය මගින් සම්ප්‍රදායික ක්ෂේත්‍රයන්, වෙනත් වැදගත් ඉගෙනීමේ ක්ෂේත්‍රයන් වන භෞතික, පෞද්ගලික සහ සමාජ කුසලතා වර්ධනය කිරීම සමඟ වඩා සමීප ලෙස සම්බන්ධ කරන අතර දැනුම නියම ලෝකයට අදාල කර ගැනීමේ හැකියාව ලබාදේ. මෙම නව ප්‍රවේශයේ අංගයන් වශයෙන් සමාජ සබඳතාවයන් වර්ධනය කිරීම, සිතීමේ කුසලතා වර්ධනය කිරීම සහ සන්නිවේදනය යන ක්ෂේත්‍රයන්හිද සම්මතයන් සකස් කර ඇත.



# දෙමාපියන් හට තොරතුරු



## ඉගෙනීමේ ත්‍රිත්ව සම්මතයන්

වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන් ප්‍රධාන ක්ෂේත්‍රයන් තුනකට සකස් කර ඇත. ඒවානම්:

- ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය, මානව විද්‍යාව, භාෂා සහ කලාව යන ප්‍රධාන විෂයයන්හි දැනුම සහ අවබෝධය
- ක්‍රියාශීලීව සහ සෞඛ්‍යය සම්පන්නව සිටීම, ආත්ම විශ්වාසය වර්ධනය කර ගැනීම, පෞද්ගලික ඉගෙනීම කළමණාකරණය සහ අන් අය සමග එක්ව කටයුතු කිරීම වැනි භෞතික, පෞ ද්ගලික සහ සමාජ නිපුණතාවයන්
- සිතීම, සැලසුම් කිරීම, ගැටළු නිරාකරණය කිරීම, සන්නිවේදනය, සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය වැනි සමස්ත විෂය මාලා ක්ෂේත්‍රයන් ඔස්සේ අදාල වන වෙනත් අත්‍යාවශ්‍ය කුසලතා.

සමබරතාවයෙන් යුත් විශ්වාසය ඇති තරුණ අයෙකු වර්ධනය කිරීම සඳහා මෙම සියළුම ක්ෂේත්‍රයන් වැදගත්වේ. මේවා බොහෝ අවස්ථාවල ළමුන්ගේ පාසැලේ අත්දැකීම්වල අංගයන්ව තිබුණද, සම්ප්‍රදායික විෂය ක්ෂේත්‍රයන් සමග සමීප ලෙස සම්බන්ධව නොතිබිණි. මේවා එකට සම්බන්ධ කිරීම මගින්, සිසුන්ගේ ඉගෙනීමට මේවායේ ඇති අගය සහ සම්බන්ධතාවය අවධාරණය කෙරේ.

## කාලයාගේ ඇවෑමෙන් වර්ධනය වී ඇති සම්මතයන්

වසර ගණනක් මුළුල්ලේ වික්ටෝරියානු පාසැල්වල විෂයමාලා සහ ඇගයීමේ සම්මතයන් පැවතිණි. සමහර අවස්ථාවල පාසැල්වල ඉගැන්වීමට තිබෙන කරුණු ප්‍රමාණය අනුව පාඨමාලාවල අන්තර්ගතය ඉතා අධික බවට දැඩි මතයක් පවතී. නව සම්මතයන් මගින් ළමුන්ගේ වයස සහ ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම අනුව විවිධ ප්‍රමුඛතාවයන් වෙත අවධානය යොමු කිරීමට පාසැල් වෙත වැඩිපුර කාලය ලබාදේ.

සිසුන් සිය පාසැල් අධ්‍යාපනයේ විවිධ අදියර පසු කරන අතරම ඔවුන් අත්‍යාවශ්‍ය ලෙස දැන ගත යුතු දේ කුමක්ද යන්න සහ ඔවුන් හට කුමක් කල හැකිද යන්න නව සම්මතයන් මගින් හඳුනා ගනී. ඔවුන් වසර 10 අවසානය වෙත ළඟා වන විට සම්මතයන් අනවරත ලෙස අභියෝගාත්මකවේ.

නව සම්මතයන්ට අනුව, මුල් වසර කිහිපය තුලදී (බාලාංශය සිට වසර 4 තෙක්) සාක්ෂරතාව සහ සංඛ්‍යානය කෙරෙහි දැඩි අවධානයක් ලබාදේ. මීට අමතරව සෞඛ්‍යය, ශාරීරික අධ්‍යාපනය සහ අන්තර් පුද්ගල සංවර්ධනය කෙරෙහි වඩා වැඩි අවධානයක් ලබාදේ.



සිසුන්ගේ ප්‍රාථමික පාසැල් කාලය තුලදී, ප්‍රධාන විෂය ධාරා තුනට අයත් විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, සහ ප්‍රජාචාරය සහ පුරවැසිභාවය යන අමතර ක්ෂේත්‍රයන් හඳුන්වා දෙනු ඇත. නව ක්ෂේත්‍රයන් හඳුන්වා දෙන අතරම සාක්ෂරතාව සහ සංඛ්‍යානය යන ප්‍රධාන ක්ෂේත්‍රයන් හටද අඛණ්ඩව අවධානය යොමු කර වැඩි දියුණු කෙරේ.

ප්‍රාථමික පාසැල් කාලය අවසානයේදී, වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන් මගින් ද්විතීයික පාසැල් හට පැහැදිලි පුරුකක් සපයාදේ. සම්මතයන් මගින් සිසුන් හට ප්‍රාථමික පාසැලේ සිට ද්විතීයික පාසැල වෙත යාමට ශක්තිමත් අඩිතාලමක් සපයාදේ. ප්‍රාථමික සහ ද්විතීයික යන පාසැල් දෙකෙහිම ගුරුවරුන් හට එක් එක් ළමයාගේ ශක්තීන් සහ අභියෝගයන් සම්බන්ධයෙන් එකිනෙකා සමග කථා කිරීමට තව දුරටත් පොදු පදනමක් පවතී.



ද්විතීයික පාසැලේදී තවදුරටත් ප්‍රධාන විෂය ධාරා තුනෙන් සම්මතයන් ලබා ගන්නා අතර මෙම අවස්ථාවේ සිසුන් හට පාසැලේ ඇති ඉගෙනීමේ අවශ්‍යතාවයන් මේ මගින් නිරූපණය කෙරේ. වසර 9 සහ 10 වන විට සම්මතයන් මගින් හඳුනා ගන්නා ආකාරයට සිසුන් සිය මනසේ සහ අවශ්‍යතාවල ස්වාධීනතාවයක් වැඩි වශයෙන් වර්ධනය කර ගන්නා අතර සිය ඉගෙනීම සහ අනාගත ගමන් මග අතර ගැඹුරු සම්බන්ධතාවයක් දැකීමට පෙලඹේ.

## මෙය සිදුවන්නේ කවදාද?

- 2006 ජනවාරි මාසයේ සිට ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ගෙන් පටන්ගෙන සියළුම වික්ටෝරියානු පාසැල් වෙත ක්‍රමානුකූලව මෙම සම්මතයන් හඳුන්වාදීම සිදු කෙරේ. 2005 වසරේදී සියළුම පාසැල් විසින් සිය විෂයමාලා තුලට ඉගෙනීම සම්බන්ධ කරන නව මාර්ග නිරූපණය කරන අතර සම්මතයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වැඩ සටහන් තිබෙන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් ආරම්භ කරනු ඇත.
- පාසැල් විසින් ක්‍රමානුකූලව සම්මතයන් අදාල කර ගන්නා අතරම පාසැල් විසින් ඉගෙනීමේ සහ ඉගැන්වීමේ මූලධර්ම ගවේෂණය කිරීමත් ඇගයීමේ සහ වාර්තා කිරීමේ මාර්ගද වැඩි දියුණු කෙරේ. සම්මතයන් ක්‍රියාත්මක වන කාලයේදී VCAA හා අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පාසැල් සහ දෙමාපියන් වෙත තොරතුරු ලබාදීම දිගටම සිදු කෙරේ.

## වැඩිදුර විස්තර ලබා ගන්නේ කෙසේද?

- සම්මතයන් ඇතුලත් http://vels.vcaa.vic.edu.au වෙබ් අඩවිය වෙත යන්න.
- අංක (03) 9651 4544 හෝ 1800 134 197 (ප්‍රාදේශීය අමතන්නන්) ඔස්සේ VCAA අමතන්න.
- රජයේ පාසැල් සඳහා ඇති සැලැසුම් සම්බන්ධ තොරතුරු සඳහා www.sofweb.vic.edu.au/blueprint/ වෙබ් අඩවිය වෙත යන්න.
- ඔබගේ දරුවාගේ පාසැල හා සම්බන්ධ වන්න.

## ඔබ හට මෙයට සහභාගි විය හැක්කේ කෙසේද?

- මෙම වැදගත් වෙනස්වීමට සහයෝගය දැක්වීම සඳහා ඔබගේ පාසැල විසින් අනුගමනය කරන ප්‍රවේශය කුමක්ද යන්න ඔබගේ පාසැල් කවුන්සිලය හෝ ඔබගේ පාසැලේ විදුහල්පතිවරයාගෙන් අසා දැනගන්න.
- සම්මතයන් හඳුන්වා දීම හේතුවෙන් වෙනස් නොවී තිබෙන්නේ මොනවාද සහ වෙනස් වන්නේ මොනවාද යන්න පාසැලෙන් අසා දැනගන්න.
- වික්ටෝරියානු අත්‍යාවශ්‍ය ඉගෙනීමේ සම්මතයන් හා සම්බන්ධ තොරතුරු සැසිවලට සහභාගිවී ප්‍රශ්න අසා දායකත්වයක් ලබා දෙන්න.

ළමුන් සහ ඔවුන් ඉගෙන ගන්නා ආකාරය වෙත අවධානය යොමු කිරීමට අප සැමට මෙය මගහු අවස්ථාවකි.

© VCAA 2005

Published by
VICTORIAN CURRICULUM AND ASSESSMENT AUTHORITY
41 St Andrews Place East Melbourne Victoria 3002 Australia
TELEPHONE +61 3 9651 4300 FACSIMILE +61 3 9651 4324
EMAIL vcaa@edumail.vic.gov.au
WEB www.vcaa.vic.edu.au

Victoria
The Place To Be